# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2384/33 – 2024 මැයි මස 17 වැනි සිකුරාදා – 2024.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

මහනුවර මහා නගර සභාවේ විනෝද බදු පැනවීම

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත (267 වන අධිකාරය වූ) 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, මහනුවර මහා නගර සභාව විසින් 2022.10.31 වැනි දින සභා සම්මත කරන ලදුව, මා විසින් අනුමත කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2335/04 හා 2023.06.05 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නිවේදනය, මහනුවර මහා නගර සභාවේ 2023.08.16 වන දින පැවති කළමනාකරණ කමිටුවේ තීරණ අංක 2023/408 යටතේ සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව පරිදි මෙහි උපලේඛනයෙහි සඳහන් ආකාරයට සංශෝධනය කරනු ලබන බව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ 2(2) උපවගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ වන මා විසින් අනුමත කරන ලද බවට එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

නීතිඥ ලලිත් යූ. ගමගේ,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2024 ජනවාරි මස 30 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A – PG6731 – 09 (2024/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ අංක 2(1) වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ විනෝද බදු අයකිරීම සඳහා වන පහත උපලේඛනයේ සඳහන් විනෝද කටයුතු සහ මුදල් අයකරනු ලබන සෑම කටයුත්තක් සඳහාම 2024.01.01 සිට ඇතුළත්වීමේ ප්‍රවේශපත්වල මුහුණත වටිනාකමෙන් 7.5% ක විනෝද බද්දක් අයකිරීම සඳහා 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතෙන් මා වෙත පැවරී ඇති බලත ප්‍රකාරව තීරණය කරමි.

තවද මෙම ප්‍රතිශතය, මේ හා සම්බන්ධයෙන් නැවත නියමයක් කරන තෙක් මෙහි පහත උපලේඛනයේ සඳහන් විනෝද කටයුතු හා මුදල් අයකරනු ලබන සෑම කටයුත්තක් සඳහාම විනෝද බදු ප්‍රතිශතය වශයෙන් සැළකිය යුතු බව ද මෙයින් වැඩිදුරටත් නිවේදනය කරමි.

**උපලේඛනය**

| *අනු අංකය* | *විනෝද කටයුත්තෙහි ස්වභාවය* | *විනෝද බදු අයකිරීමේ ප්‍රතිශතය* |
|---|---|---|
| 1 | • සිනමා දර්ශන | 7.5% |
| 2 | • විදේශීය කලාකරුවන් සහභාගිවන සියලුම ප්‍රසංග | 7.5% |
| 3 | • සියලුම සැණකෙළි හා ශූර ක්‍රියා (සර්කස් ඇතුළුව)<br>• මැජික් සංදර්ශන, විචිත්‍රාංග සංදර්ශන හා විචිත්‍රාංග තරඟ<br>• උඩරට නැටුම් සංදර්ශන | 7.5% |
| 4 | • වානිජ පරමාර්ථයෙන් පවත්වනු ලබන දේශීය ශිල්පීන් සහභාගිවන සියලු ප්‍රසංග සඳහා | 7.5% |
| 5 | • ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ<br>• ජාතික/දේශීය ක්‍රීඩා තරඟ (පාසල් ක්‍රීඩා හැර) | 7.5% |
| 6 | • ක්‍රියාත්මක මට්ටමේ පවතින කලාකරුවන්ගේ සංගමයක් මූලිකව පවත්වනු ලබන ප්‍රසංග<br>• දැනට ප්‍රසිද්ධ කලාකරුවන් විසින් තම ජීවිතයේ විශේෂ අවස්ථාවක් ලෙස පවත්වනු ලබන ප්‍රසංගයක් සඳහා | 7.5% |
| 7 | • සුභ සාධක සංගම්, ආදි ශිෂ්‍ය සංගම් සහ එවැනි සමිති හා සමාජ සංවිධාන විසින් පවත්වනු ලබන ප්‍රසංග<br>• පාසලක් විසින් පාසල් සුභසාධනය සඳහා පවත්වනු ලබන, අයදුම්කරු විදුහල්පති වන, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිත ප්‍රසංග<br>• පාසලක් හෝ ආදි ශිෂ්‍ය සංගමයක් හෝ විද්‍යාලයීය සංගමයක් පාසලක් වෙනුවෙන් පවත්වන ක්‍රීඩා තරඟ හා පාසල් ක්‍රීඩා සංගම් විසින් පවත්වන තරඟාවලි<br>• උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍ය සංගමයක් විසින් ශිෂ්‍ය සුභසාධනය සඳහා පවත්වන විනෝද කටයුතු සහ ආදායම් රැස්කිරීමේ අරමුණින් පවත්වන සංදර්ශනයන්<br>• දේශීය වේදිකා නාට්‍ය ගීත සහිත ප්‍රසංග | 7.5% |
| 8 | • දේශීය ශිල්පීන් සහභාගිවන ආහාරපාන රහිතව මිල වන DJ ප්‍රසංග, නැටුම් සංදර්ශන, Sing Alone සහ වෙනත් නැටුම් වැයුම් සහිත ප්‍රසංග<br>• DINNER DANCE/SING ALONE (ආහාර පාන සමග මිල වන) | 7.5% |

EOG 05 – 0127

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.